# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1942/8 - 2015 නොවැම්බර් මස 23 වැනි සඳුදා - 2015.11.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

නිවේදනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 43(1) අනු ව්‍යවස්ථාව යටතේ ආරක්ෂක විෂයභාර අමාත්‍යවරයා වශයෙන් මා හට පැවරී ඇති විෂයයන් හා කාර්යයන් සහ දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා 2015.09.11 දින සිට පහත උපලේඛනය සඳහන් වන පරිදි පවරා දී ඇති බව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(5) අනු ව්‍යවස්ථාව ප්‍රකාරව මවිසින් මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෛත්‍රීපාල සිරිසේන,<br>ජනාධිපති,<br>ආරක්ෂක අමාත්‍ය.

2015 නොවැම්බර් මස 18 වැනි දින,<br>කොළඹ 03,<br>ආරක්ෂක අමාත්‍යාංශය.

උපලේඛනය

(1) ආරක්ෂක රාජ්‍ය අමාත්‍ය

| *I වැනි තීරුව*<br>*කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව*<br>*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | | *III වැනි තීරුව*<br>*ක්‍රියාත්මක කළ යුතු නීති* |
|---|---|---|---|
| 1. II වැනි තීරුවෙහි දැක්වෙන ආයතනයන් අධීක්ෂණය කිරීම හා මෙහෙය වීම. | 1. ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලය | * | ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාල පනත (2008 අංක 05) |
| 2. III වැනි තීරුවෙහි දැක්වෙන පනත් ක්‍රියාත්මක කිරීම | 2. රණවිරු සේවා අධිකාරිය<br>3. ආරක්ෂක සේවා පාසල<br>4. ජාතික ශිෂ්‍ය භට බලකාය | * | රණවිරු සේවා අධිකාරය පනත (1999 අංක 54) |

12-330


1A - G 22623— 358 (2015/11) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*